# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2396/35 - 2024 අගෝස්තු මස 08 වැනි බ්‍රහස්පතින්දා - 2024.08.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: ARA/LND/ACQVI/D3/52.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 4-3/15/2018/VE/08.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම / පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ / පරවශතාවේ විස්තර:*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්බොඩ කෝරළේ (බටහිර) සුළු කොට්ඨාසයේ අංක 43බී, ගැටබේරිකන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වැලිමන්න ගමේ පිහිටි ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2019.12.17 දිනැතිව පිළියෙල කරන ලද මු.පි.කෑ. 3742 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0202ක් පමණ වූ නිකතැන්න වත්ත නැමැති ඉඩම සඳහා මායිම්.

**කැබලි අංක 01 - ඉඩමේ නම: නිකතැන්න වත්ත; වෙනත් කරුණු: ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ අත්කර ගන්නා ලදී, මුල් හිමිකම් පාන්නා සොයාගත නොහැක. අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0202**

*උතුරට*: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ නිකතැන්න වත්ත; *නැගෙනහිරට*: නිකතැන්න වත්ත සහ බුවැලිගොඩ වත්ත; *දකුණට*: මාර්ගය, බුවැලිගොඩ වත්ත සහ නිකතැන්න වත්ත; *බටහිරට*: නිකතැන්න වත්ත සහ මාර්ගය.

ඉහත සඳහන් ඉඩමට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2024 සැප්තැම්බර් මස 11 දින පෙ.ව.10.00** ට අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, **2024 සැප්තැම්බර් 04** වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**ෂාමලී පියතිස්ස,**
ප්‍රාදේශීය ලේකම්,
අරණායක.

2024 අගෝස්තු මස 02 වැනි දින,
අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0095

ශුද්ධි පත්‍රයයි

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: MO/ED/03/ACQ/20.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 4/3/4/2014/LO/431.

මොනරාගල පොලිස් අධිකාරී කාර්යාලය සඳහා රජයට අත්පත් කර ගත් ඉඩම් වෙනුවෙන් පළ කරන ලද අංක 2142/13 දරන 2019.09.24 දිනැති 7 වන වගන්තිය යටතේ *ගැසට්* නිවේදනයේ ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් කියන හෝ වෙනත් සම්බන්ධකම් කියන සියළු දෙනා පැමිණ 2019.10.29 දින මා සම්මුඛ විය යුතු ලෙස සහ අංක 2374/22 අංක දරන 2024.03.06 දිනැති ශුද්ධිපත්‍රයෙහි සඳහන් 2024.03.27 යන දිනයන් 2024.11.25 ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

**ඩබ්ලිව්. ඩී. පී. සී. සමරසේකර,**
ප්‍රාදේශීය ලේකම්,
මොනරාගල.

2024 ජුලි මස 31 වැනි දින,
මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය.

EOG 08 - 0061

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.